
# සිංහයාට අපූරු පාඩමක්



# සිංහයාට අපූරු පාඩමක්

ඔමන්සා දිනුලිනී බණ්ඩාර
කතෘ

මහ/මහාමායා බාලිකා විදුහල
3 ශ්‍රේණිය D

කෘතිය පළ කරන දිනය : 2026.05.10
ISBN අංකය : 150001

# පිදුම

මගේ ආදරණීය මහාමායා බාලිකා විදුහලේ
ගරු විදුහල්පතිතුමියට සහ
මට අකුරු කියා දුන් සියලුම ගුරුතුමියන්ට,
මගේ ආදරණීය අම්මාට, අප්පච්චීට,
මගේ වැඩ වලට හැමදාමත් උදව්වන
ආදරණීය අයියාට,
දඟකාර චූටි මල්ලිට,
මගේ යාළුවෝ හැම දෙනාට
මේ "සිංහයාට අපූරු පාඩමක්" කියන
මගේ පළවෙනි කතාන්දර පොත
හරිම ආදරයෙන් පුදමි!

මෙයට
ඔයාලාගේ ආදරණීය
ඔමන්සා දිනුලිනී බණ්ඩාර
3 ශ්‍රේණිය D
මහ/මහාමායා බාලිකා විදුහල



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකෝමත් එක ගමක නිකිණි කියලා
පුංචි ළමයෙක් හිටියා.
මේ නිකිණිට යාළුවෝ ගොඩාක්
හිටියා.
නිකිණි පාසල ඇරිලා යළුවොත් එක්ක
සෙල්ලම් කරන්න යනවා.
ගමේ ලොකු පිට්ටනියක් තිබුණා.



ඉතින් නිකිණි එයාගෙ යාළුවොයි මේ පිට්ටනියටයි
සෙල්ලම් කරන්න යන්නේ.
මේ පිට්ටනිය ළඟ කැළෑවක් තිබුණා.
ඉතින්, එක දවසක් මේ නිකිණියි එයාගේ යාළුවොයි
එක දිගට සෙල්ලම් කර කර
ඉන්න අතරේ කැලෑවේ හිටිය සිංහයෙකුත් බලාගෙන හිටියා.
ඉතින් මේ සිංහයාට හිතුනා නිකිණිවයි එයාගේ යාළුවොයි
කන්න ඕන කියලා.සිංහයා බලාගෙන ඉදියා.



අලුත් දවසක් උදාවුණා.
නිකිණියි,එයාගේ යාළුවොයි පිට්ටනියට ආවා.
හැමෝම සෙල්ලම් කරන අතරේ
මේ සිංහයා හෙමින් හෙමින් පිට්ටනියට ළඟා වුණා.



සිංහයා පිට්ටනියට ආව හැම ළමයෙක්ම කාලා දැම්මා.
හොඳටම හවස් වුණා.
ඉතින් මේ ළමයින්ගේ දෙමව්පියන් බලන් හිටියා.
තවම ළමයින් ආවේ නැහැ.
දෙමව්පියන් හැමතැනම බැලුවා.
පේන්න හිටියේ නැහැ.



කැලේ දර කපන්නාගෙන් ඇහුවා.
"සිංහයෙක් ගොරවන සබ්දයක් ඇහුණා'
දර කපන්නා කිව්වා.
දෙමව්පියන් කැලේ පැත්තට ගියා.



පඳුරක් පිටිපස්සේ ගොරවන ශබ්දයක් ඇහුණා.
හැමෝම සිංහයාව දැක්කා.
සිංහයාට හොඳටම නින්ද ගිහිල්ලා හිටියේ.



"සිංහයාගේ බඩ හොඳටම ලොකුයි" කියලා,
නිකිණිගේ තාත්තා කිව්වා.
සිංහයාගේ බඩින් පොඩි ශබ්දයක් ඇහුණා.
"අනේ, අපිව එළියට ගන්න",
කියලා කියනවා කතා කරන ශබ්දයක් කට්ටියට ඇහුණා.



"ඒ අපේ ළමයින්ගේ කටහඬ",
කියලා එක යාළුවෙක්ගේ අම්මා කෙනෙක් කිව්වා.
"සිංහයා අපේ ළමයින්ව කාලා ඇති"
කියලා නිකිණිගේ අම්මා කිවුවා.
දෙමව්පියන් එකතුවෙලා සිංහයාගේ බඩ හෙමිහිට කැපුවා.
ළමයින්ව එළියට අරගෙන බඩට ගල් දාලා මැහුවා.



උදේ වුණා.සිංහයා අවදි වුණා.
සිංහයාට අමාරුවක් දැනුණා.
ගඟ ළඟට ගියා.
සිංහයාට එයාව පාලනය කරගන්න බැරි වුණා.
හයියෙන් කෑ ගහලා "මාව බේරගන්න" කිව්වා.
කවුරුත් ආවේ නැහැ.
අන්තිමට සිංහයා ගඟේ ගිලිලා මැරුණා.



එදා සවස ආයෙමත් හැම යාළුවෙක්ම
ආයෙත් පිට්ටනියට ආවා.
"අපි සෙල්ලම් කරන්න දවස් 3ක් වෙන් කර ගමු."
කියලා නිකිණි කිව්වා.හැමෝම කැමති වුණා.
ඒ විතරක් නෙවෙයි, යාළුවෝ හැමෝම පාඩම් වැඩත් කරා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN: 1S50001**